කෙටි කතාව

# සමාවන් තිලක මට !

නිවසේ පසු මිදුලට මුහුණ ලා ඇති හාන්සි පුටුවේ විවේකීව හිඳ ඇබොරිජිනල් ජාතික මොන්ටි පර්'යර්' ගේ "May Be Tomorrow" මැයෙන් ලියැවුනු මොන්ටි ගේ චරිතාපදානය කියවමින් සිටි සිරිමෙවන් අඩ නින්දකට නිතැතින්ම යොමුවුනේ ඔහුටත් හොරාය. ඇබොරිජිනල් වරුන් පිලිබඳව සිරිමෙවන් වැනි ඔස්ට්‍රේලියාවට මෑතක සංක්‍රමණය වුන බොහෝ උදවියගේ සිත් තුල පැලපදියම් වන්නේ රූපවාහිණී නාලිකා සහ වෙනත් මාධ්‍යයන් හරහා නිරන්තරයෙන් ඇසෙන සහ කියවන තොරතුරු පමණි. ඇබොරිජිනල් ජාතිකයන් කම්මැලි, සුරාවට ඇබ්බැහිවුන සොරකම ඇතුලු දහසක් නීති විරෝධී ක්‍රියාවන් හී යෙදෙමින් රජයෙන් ලැබෙන ආධාර වලින් යැපෙන සමාජ විරෝධී කන්ඩායමක් බවට ඒදිනෙදා ඇස ගැටෙන දේ සනාථ කරන සාධක හැර එයට පටහැනි කිසිවක් සිරිමෙවන් අසා නොමැති අතර ඒතැනින් එහා ඔවුන් ගැන සිතීමට සිරිමෙවන් යොමුකරන කිසිම නිමිත්තක් ඔහුට මීට පෙර නොලැබුනි. නූතන සමාජයේ ජීවත් වන අප කොයි කවුරුත් තීරණවලට එලඹෙනුයේ සිද්ධියක හෝ සිද්ධි සමුච්චයක එක් පැති කඩක් දෙස බලා පමණක් බව සිරිමෙවන්ට කෙමෙන් වැටහෙමින් තිබුන සමාජ යථාර්'තයක් යලි තහවුරු කලේ මොන්ටි ගේ ජීවිත කථාව දැයි සිතමින් සිටි සිරිමෙවන් සිහින ලෝකයේ තනිවන්නට විය. මෙම සිහින ලෝකයේ තනිවීම සිරිමෙවන් කුඩා කල සිට පුරුදු පුහුණු වූවක් විය.

ඉහත කී මොන්ටි ගේ චරිතය කියවූ සිරිමෙවන්ට Dreaming යනුවෙන් ඉංග්‍රීසියට පරිවර්'තනය කර ඇති ඇබොරිජිනල් ජාතික සිරිතක් ඇති බවත් ඉංග්‍රීසි පදය සිරිතේ යථා අර්'ථය නියම ලෙස පිලිඹිබු කරන්නේදැයි සැක සිතුනද සිරිමෙවන්ගේ සිහින ලෝකයට පිවිසීම එයට සමීප සිරිතක්දෝ යැයි හැඟෙන්නට විය. මෙම ඇබොරිජිනල් සිරිතට වෙනත් තුල්‍යාර්'ථ පදයක් නොදන්නා හෙයින් එය සිහින ලෝකයට පිවිසීම ලෙස නම් කිරීම සාධාරණදැයි සැකයක් සිරිමෙවන් තුල බිහිවුනද ඔහු සතු වෙනත් මඟක් නැති හෙයින් සිහින ලෝකයට පිවිසීම යනුවෙන්ම එම සිරිත නම් කිරීමට සිරිමෙවන්ට සිදුවිය. මෙසේ සිහින ලෝකයට පිවිසුන සිරිමෙවන්ට මෑතක ඔස්ට්‍රේලියානු රජය ඇබොරිජිනල් ජාතිකයන් ගෙන් නීතිමය වශයෙන් සමාව ඉල්ලීමේ වටිනා කමෙහි අගය වැටහෙන්නට පටන් ගත් අතර නිතැතින්ම තම ජීවිතය හාරා අවුස්සා තමා සමාව අයැදිය යුතු අයෙක් ඇද්දැයි සිතන්නට පටන් ගත්තේ අඩ නින්දේදීදැයි සිතේ.

සිරිමෙවන් ඉපදුනේ කොළඹින් බොහෝ ඈත දේශපාලනමය වශයෙන් උග්‍ර වාමාංශික වුන ගම්මානයකය. එහි මධ්‍යම පාංතික පවුලක උපන් සිරිමෙවන්ගේ පියා, අතලොස්සක් වූ එක්සත් ජාතික පාක්ෂිකයන් අතර ප්‍රධාන තැනක් ඉසිලීය. අසල්වැසියන් හා සිරිමෙවන්ලා ගේ පවුල අතර ඇති සහසම්බන්ධතාවය හුදෙක් උඩින් මිතුරු එහෙත් සැකයෙන් පිරුන මිත්‍රත්වයක් විය. තමන් පිලිගන්නා දේශපාලක පක්ෂය ආගම මෙන් අදහන ගැමියන් අතර මෙවන් සම්බන්ධතාවයන් බහුල වීම සිරිමෙවන්ට අද පුදුමයක් නොවුනද එදා වටහා ගත නොහැකි ගැටලුවක් විය. කුඩා සිරිමාන්න අසල්වාසී සම වයසේ දරුවන් සමග කෙලිසෙල්ලමට ලොල් කලද ඒ සඳහා දෙමව්පියන්ගෙන් ලද ප්‍රතිචාරය දිරීමත් කරන්නක් නොවීම නිසාම වැඩිපුර කාලය ගත කලේ බොහෝ විට සිහින ලෝකයක තනිවීමෙනි. මෙම වකවානුවේ සිරිමෙවන් සතර වන වසරේ' අධ්‍යාපණය ලබමින් සිටි අතර, තම නිවසට පසුපස කන්ද උඩ පිහිටි නිසාම උඩහ ගෙදර නමින් හැඳින්වුන නිවසේ දරුවන් සමග කෙළි සෙල්ලමට යාමට වරින් වර පුරුදු විය.

මෙන්ඩිස් අයියා නමින් සිරිමෙවන් ගේ තාත්තා හැඳින්වූ එම නිවසේ හිමිකරු උග්‍ර සමසමාජ පාක්ෂිකයෙකු වුවද සිරිමෙවන් ගේ පියා ඔහු කෙරෙහි කිසියම් පැහැදීමක් ඇති බව කුඩා සිරිමෙවන්ට වැටහුනේ තම පියා එකල පැවති මහා මැතිවරණයේදී මෙන්ඩිස් අයියාගේ ඉල්ලීම පරිදි සමසමාජ පක්ෂයේ මැතිවරණ කාර්'යාලය ලෙස තම නිවසේ කොටසක් දීමට එකඟ වූ හෙයිනි. මෙම ක්‍රියාව කුඩා සිරිමෙවන්ට තේරුණ ආකාරයට වෙසක් උත්සවය සඳහා කතෝලික පල්ලියේ කොටසක් බාර දුන්නාක් මෙනි. කුඩා සිරිමාන්නට මෙම උදාහරණය සිතට ආවේ මේ වන විට ඔහු නගරයේ කතෝලික පාසලක අධ්‍යාපණය ලබමින් සිටි හෙයිනි. තමාගේ ගමේ පාසලේ මිතුරන්, තමා නගරයේ පාසලේ අධ්‍යාපණය ලැබීම කෙරෙහි කිසියම් ඉරිසියාවකින් පෙලෙන බව ඉඳ හිට ගමේ මිතුරන් සමග සෙල්ලමට ගිය සිරිමෙවන්ට ඔහුව කොන්කිරීම් තුලින් වැටහුන හෙයින් ඔහු තම සිහින ලෝකයේ තනිවීම වඩා අගයන්නට පුරුදු විය. දිනක් පාසල හැරී ගෙදර ආ සිරිමෙවන්ට දැන ගන්නට ලැබුනේ උඩහ ගෙදර දරුවකු වන පෝලියෝ රෝගය නිසා අංග විකලවූ කොළඹ අංග විකල දරුවන්ට වෙන්වූ නිවාසයක අධ්‍යාපනය ලබමින් සිටි තිලක එම ආයතණයේ රඳවා ගන්නා වයස ඉක්මවා ඇති හෙයින් ආපසු ගෙදර එවා ඇති බවය. දවල් ආහාරය වත් නොගත් සිරිමෙවන් වහා උඩහ ගෙදරට දිව ගියේ තිලක ගැන අසා තිබුනද කිසි දිනක මුණ නොගැසුන තිලක දැකීමටය. තිලක දුටු සිරිමෙවන්ට ඇතිවුනේ දැඩි අනුකම්පාවකි. සිරිමෙවන්ගේ වයසේම උවද සිරුරීන් නොවැඩුන තිලක කුඩා දරුවකු මෙන් කුඩා ට්‍රයිසිකලයක සිටි අතර ඔහුගේ අත් දෙකද පූර්'ණ වශයෙන් හැසිරවීමට



සිතුවම - සුනිල් ශාන්ත අමරකෝන්


***දවල් ආහාරය වත් නොගත් සිරිමෙවන් වහා උඩහ ගෙදරට දිව ගියේ තිලක ගැන අසා තිබුනද කිසි දිනක මුණ නොගැසුන තිලක දැකීමටය. තිලක දුටු සිරිමෙවන්ට ඇතිවුනේ දැඩි අනුකම්පාවකි. සිරිමෙවන්ගේ වයසේම උවද සිරුරීන් නොවැඩුන තිලක කුඩා දරුවකු මෙන් කුඩා ට්‍රයිසිකලයක සිටි අතර ඔහුගේ අත් දෙකද පූර්'ණ වශයෙන් හැසිරවීමට ඔහුට හැකියාවක් නොමැති බව දුටු සිරිමෙවන්ගේ සිත දයානු කම්පාවෙන් පිරී ඉතිරී ගියේය. එහෙත් දැඩි පීවයෙන් පිරුණ බවක් තිලක තුල ඇති බව දුටු සිරිමාන්නගේ සිත වහා ඔහු කෙරෙහි බැඳී ගියේය.***


ඔහුට හැකියාවක් නොමැති බව දුටු සිරිමෙවන්ගේ සිත දයානු කම්පාවෙන් පිරී ඉතිරී ගියේය. එහෙත් දැඩි පීවයෙන් පිරුණ බවක් තිලක තුල ඇති බව දුටු සිරිමාන්නගේ සිත වහා ඔහු කෙරෙහි බැඳී ගියේය.

එතැන් පටන් පාසල හැරී ගෙදර ආ විගස දවල් ආහාරය ගත් වහාම තිලක දැකීමට යන සිරිමෙවන් දාං ක්‍රීඩාවේ දක්ෂයකු වූ තිලක සමග දාං ඇදීම පටන් ගනී. මේ වන විට සත්වන වසරේ' උගත් සිරිමෙවන් හා තිලක දැඩි මිතු දමකින් බැඳෙන්නට වැඩි කලක් ගත නොවීය. අංග විකල දරුවකු වන තිලක සමග දැඩි මිතුරකු බවට සිරිමෙවන් පත්වූයේ ඔවුන් දෙදෙනා අතර තිබූ දාං ඇදීමේ දක්ෂතාවය යයි එදා සිතුවද ඊට යටින් දිවෙන යථාර්'තය නම් අංග විකල දරුවකුට මිතුරන් හීන වීමත්, සිරිමෙවන් හා ඔහු ගේ අසල් වැසි දරුවන් සමග නොග ැලපීම නිසා ඔහු තුල තිබූ තනිකමත් දැයි සිරිමෙවන්ට දැන් සිතේ. සෑම ඉරිදාකම උදයෙන්ම සිරිමෙවන් ගේ නිවසට තම සොහොයුරෙකු ලවා ට්‍රයිසිකලය තල්ලු කරව ගන්නා තිලක, සිරිමෙවන් සමග පිලිසඳරේ' යෙදීමත් සිරිමෙවන් ගේ ගෙදර ඇති ඉරිදා පුවත් පත් සියල්ලම කියවීමත් සති අන්ත දින චරියාව කරගන්නට විය.

සතියේ දිනවල දාං ඇදීමේ යෙදීමත් සති අන්තයේ තොරතෝංචියක් නැතිව තිලක සමග වල්පල් දෙඩවීමත් සිරිමෙවන් ගේ දෙමව්පියන් ක්‍රමයෙන් නොරුස්සන්නට පටන් ගත් අතර ඔවුන් ගේ හැසිරීම් රටාව මගින් තිලක ටද මෙය වැටහෙන්නට පටන් ගත්තේය. ක්‍රමයෙන් සිරිමාන්නගේ නිවසට පැමිණීම අඩු කල තිලක, සිරිමාන්නගේ නිවස අසලින්ම වැටී තිබූ තිලකලාගේ ගෙදරට යන අඩිපාර පාමුලට ට්‍රයිසිකලය තල්ලු කරවාගෙන සිරිමාන්න පාසල් හැරී පැමිනෙන තෙක් බලා සිටීම පුරුද්දක් කරගත්තේය. සිරිමාන්නද පාසල හැරී පැමිණි වහාම දවල් ආහාරය ගෙන ගෙදරට හොරා තිලකගේ ට්‍රයිසිකලය තල්ලු කර ගෙන තිලකගේ ගෙදරට ගොස් දාං අදින්නට පුරුදු විය. සිරිමාන්නගේ මව මෙම ක්‍රියාවලිය නොරිස්සූමුත් සිරිමාන්නට කිසිවක් නොකීවද සිරිමාන්නගේ පියා හැන්දෑවේ ගෙදර ආ විගස චෝදනා ස්වරයෙන් ඔහුට සිරිමාන්නගෙ හැසිරීම පැවසීම දෛනික පුරුද්දක් කරගත්තාය. තාත්තා ගෙන් බැණුම් ලැබීම දෛනිකව සිදුවුනද, සිරිමාන්න පාසල හැරී පැමිණි විගස තිලක හමුවීමට යාම අත්හැරියේ නැත.

කාලය ගෙවී යද්දී සිරිමාන්න සාමාන්‍ය පෙල පලමු වසරට සමත් වීමත් සමග පාඩම් කිරීමේ නාමයෙන් සිරිමාන්නට ගෙදරින් පැමිනෙන බලපෑම් අධික වූ අතර නොකමැත්තෙන්ම තිලක හමුවීම අතපසු කරන්නට සිදුවිය. සමහර දිනක තමා පැමිණෙන තෙක් තිලක මඟ බලාගෙන සිටින අයුරු ජනේලයෙන් දකින සිරිමෙවන්ට කිසියම් දුකක් දැනුනද එය ක්ෂණික හැඟීමක් පමණක් විය. බොහෝ වේලා බලාසිට තම සොයුරා සමඟ ආපසු යන තිලක දෙස සමහර විට සිරිමෙවන් හොරෙන් බලා සිටියේ තම දෙමව්පියන් ලවා තමාට බැණ වැද්ද වීමට පැමිණෙන කරදර කරුවෙකුය යන හැඟීමෙන් යයි සිරිමෙවන්ට දැන් සිතේ.

ක්‍රමයෙන් සිරිමෙවන් තිලක හමුව මඟ හැරීම ක්‍රියාත්මක කලද නිති පතා සිරිමෙවන් පාසල ඇරී පැමිණෙන තුරු මඟ බලා සිටින තිලකට සිරිමෙවන් එදා අනුකම්පා කලේදැයි ඔහුට දැන් සැක සිතේ. මෙම මඟහැරීමේ ක්‍රියාදාමය සිදුවන්නේ දෙමව්පියන් උදෙසා යයි එදා සිරිමෙවන් තම සිත සැහැල්ලු කර ගත්තද අද ඒ පිලිබඳ ඔහුට පසුතැවිල්ලක් ඇතිවේ. මෙම සිද්ධි මාලාව සිදුවෙමින් පැවතුන දිනවලම තම පවුලේ සිදුවෙමින් පැවතුන වෙනස් කම් හේතුකොට ගෙන ගමින් කොළඹට සංක්‍රමණය වීමට සිරිමෙවන් ගේ පියා තීරණය කරන ලදී.

ගමින් පිටව එන දා සිරිමෙවන් තමන් අලුතින් යන ලෝකය ගැන සිහින මවමින් සිටි අතර තිලකගේ ගෙදරට යන ගුරු පාර පාමුල සිට බලා සිටින තිලකගේ රුව දුටුවේ චායා මාත්‍රයක් ලෙස පමණි. තිලකගේ මුහුණේ රැ ඳී තිබූ වියොව දුටු සිරිමෙවන්ට ඔහු ලඟට ගොස් සමුගැනීමට සිත් නුදුන්නේ මන්දැයි සිරිමෙවන්ට අද ද පැහැදිලි නැත. ඒ' ගමින් කොළඹට එන පුහු උජාරුව දැයි දැන් දැන් සිරිමෙවන් සිතයි. ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වන සමහරුන් ට ඇතිවන්නේ ද එවන් උජාරුවක් දැයි ඔහු සිතන්නට විය. අද තිලක ජීවතුන් අතර ඇද්දැයි සිරිමෙවන් නොදනී. නිවාඩුවකට ලංකාවට ගිය විටකදී වත් තිලක ගැන සොයා බලන්නට නොසිතීම ගැන සිරිමෙවන් ගේ සිත දැඩි කම්පණයට පත්වන්නේ අදය. තිලක සමග දාං ඇදීමෙන් ලද අභ්‍යාසය පසුව සිරිමෙවන්ට දක්ෂ චෙස් ක්‍රීඩකයකු වීමට ඉවහල් වුනද බොහෝ වර චෙස් තරඟ වලින් ජයග්‍රහණය කල මොහොතකවත් තිලක ගැන සිහිනොවූයේ ඇයිදැයි සිරිමෙවන්ට සිතාගත නොහැකි ය.

තමා ගුණමකුවකැයි සිරිමෙවන්ට අද සිතේ. ලබන වර ලංකාවට ගිය වහාම තිලක ගැන සොයා බලන්නට අදිටන් කරගත් සිරිමෙවන් සිහින ලෝකයෙන් මිදුනේ තම ගුණමකු කම ඉවසා සිටිය නොහැකි හෙයිනැයි සිරිමෙවන්ට සිතේ.

*(මනඃ කල්පිත කථාවක්ම නොවේ)*

**විජයසිරි තිලකුමාර**
බ්‍රිස්බේන්